# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,392 - 2024 ජූලි මස 05 වැනි සිකුරාදා - 2024.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 594 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 597 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි 12 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

593 - B 82583 — 5,403 (2024/06)

# පළාත් පාලන නිවේදන

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාර ව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ නාවල පංසල පාරේ අතුරු මාර්ගය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට පවරා ගැනීමට විරෝධතා කැඳවා දැන්වීම් ප්‍රසිද්ධ කළ අතර අදාළ කාලය තුල කිසිදු විරෝධතාවයක් නොලද හෙයින් පහත උපලේඛනයේ සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වා ඇති දිග හා පළල අනුව මින් ඉදිරියට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සතු දේපළක් ලෙසට සළකා නඩත්තු කරනු ලබන බවට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. ඒ. ශාලිකා එස්. රණවීර,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2024 ජූනි මස 27 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

| *අනු අංකය* | *පාරේ නම* | *මායිම් සීමාව සිට දක්වා* | *මිනින්දෝරුගේ නම සහ මැනුම් සැලසුම් අංකය* | *පාරේ දිග* | *පාරේ පළල* |
|---|---|---|---|---|---|
| 01 | නාවල පන්සල පාරේ අතුරු මාර්ගය | වරිපනම් අංක 121, 121/2, 121/3, 121/4, 121/5 | එස්. වික්‍රමසිංහ සැලසුම් අංක 20184 | අඩි 145 (44.25m) | අඩි 10.5 (3.2m) සිට අඩි 11.2 (3.4m) දක්වා |

07-304/1

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි

### වීථි නම් කිරීමේ නිවේදනය

1975 අංක 04 දරන වීථි නම් කිරීම සහ ස්මාරක ඉදි කිරීම පාලනය කිරීමේ පනතේ 71 (1) වගන්තිය ප්‍රකාරව සහ මහා නර සභා ආඥාපනතේ විධි විධානයන්ට අනුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග මෙහි පහත උපලේඛනයේ විස්තර සඳහන් පරිදි නම් කිරීමට බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

මින් ඉදිරියට උපලේඛනයේ සඳහන් මාර්ගයන් යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| *අනු අංකය* | *වර්තමාන නම* | *යෝජිත නම* |
|---|---|---|
| 01 | රාජගිරිය ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය, තැපැල් කාර්යාලය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඇතුලු පොදු ආයතන රාශියක් පිහිටා ඇති, වැලිකඩ පරණ කෝට්ටේ පාරෙන් ආරම්භ වන සරණ මාවත දක්වා ඇති වරිපනම් අංක 341/1, 341/2, 341/3, 341/4, 341/5, 341/5 1/1 සිට 341/5 4/1 දක්වාත් 341/6, 341/12, 341/16, 341/20, 341/20ඒ, 341/21, 341/21 2/1 සහ 341/22 දක්වා වන අතුරු මාර්ග | "සවැනි පැරකුම්බා රජ මාවත" |

| අනු අංකය | වර්තමාන නම | යෝජිත නම |
|---|---|---|
| 02 | නුගේගොඩ ස්ටැන්ලි තිලකරත්න මාවතේ ගල්වලවත්ත යනුවෙන් හඳුන්වන වරිපනම් අංක 166, 166ඒ, 166බී, 166/1, 166/2, 166/3, 166/4, 166/4ඒ, 166/4සී, 166/8ඒ1, 166/9, 166/4සී 1/1, 166/9 1/1, 166/10, සිට 166/26ඒ දක්වාත්, 166/29, සිට 166/32, දක්වා වන අතුරු මාර්ග | "අරුණළු පෙදෙස" |
| 03 | වැලිකඩ පරණ කොට්ටාව පාරෙන් ආරම්භ වන දූනට ධර්මපාල පෙදෙස යනුවෙන් හඳුන්වන වරිපනම් අංක 01, 01 1/1, 3, 11, 11 1/1, 13 13ඒ, 15, 17, 17 1/1, 17 1/2, 17/1, 17 2/1, 17/1 1/1, 27, 29, 31, 41, 45, 47, 47ඒ, 53, 53/10, 53/11 සිට 53/15 දක්වාත් 53/17, 53/19, 53/20, 53/21, 53/24 සිට 53/31 දක්වාත් 53/3, 53/3 1/1, 53/34, 53/38, 53/38ඒ, 53/4, 53/4 1/1, 55, 55ඒ, 55බී, 59, 59 1/1, 61, 65, 73, 73/1, 73/1ඒ, 75,77, 79, 83, 85, 85/1, 85/2, 87, 55බී, 2, 2 1/1, 2 2/1, 06, 20, 20 1/1, 22, 24, 24/1, 24/2, 30, 34 සිට 34/7 දක්වාත් 38, 40 සිට 40/5 දක්වාත් 42, 44 සිට 44/3 දක්වාත් 52, 52ඒ, 54 සහ 56 දක්වා වන අතුරු මාර්ග | "ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත" |
| 04 | බණ්ඩාරනායකපුර හීන් ඇළ අසල මාර්ගය වරිපනම් අංක 2, 2ඒ, 4, 4/1, 12/11, 12/13, 12/13 1/1, 12/14, 12/5 6බී දක්වා වන අතුරු මාර්ග | "පූජ්‍ය වැකඩ සිරිනිවාස නාහිමි මාවත" |
| 05 | රාජගිරිය වැලිකඩ ශ්‍රී ජයවර්ධනපුර මාවත 5 වන පටුමග අංක 425/7ඒ දරන නිවස පිහිටා ඇති ව. අ. 425 සිට 425/7 ඒ 1/1 දක්වා සහ 431 දක්වා වන මාර්ග | "ආටිගල උද්‍යානය" |

ආර්. ඒ. ශාලිකා එස්. රණවීර,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2024 ජුනි මස 27 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

07-304/2

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි

**වීථි නම් කිරීමේ නිවේදනය**

1975 අංක 04 දරන වීථි නම් කිරීම සහ ස්මාරක ඉදි කිරීම පාලනය කිරීමේ පනතේ 71 (1) වගන්තිය ප්‍රකාරව සහ මහා නගර සභා ආඥාපනතේ විධි විධානයන්ට අනුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග මෙහි පහත උපලේඛනයේ විස්තර සඳහන් පරිදි නම් කිරීමට බස්නාහිර පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

මින් ඉදිරියට උපලේඛනයේ සඳහන් මාර්ගයන් යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

*උපලේඛනය*

| අනු අංකය | වර්තමාන නම | යෝජිත නම |
|---|---|---|
| 01 | බැද්දගාන පාර, උතුර පිටකෝට්ටේ අංක 92/2, 92/2ඒ, 92/2ඒ1, 92/2බී, 92/2බී1, 92/3, 92/4, 92/6, 92/6/1/1, 92/6ඒ, 92/7 දක්වා | "ඇල්හේන මාවත" |

| *අනු අංකය* | *වර්තමාන නම* | *යෝජිත නම* |
|---|---|---|
| 02 | නුගේගොඩ පාගොඩ 1 වන හරස් වීදියේ, සමූපකාරය ඉදිරිපිට ඇති වරිපනම් අංක 41 න් පටන් ගන්නා අතුරු මාර්ගයේ වරිපනම් අංක 21/12බී, 41, 41ඒ, 41ඒ1/1, 41බී, 41/1සී, 41/1, 41 1/1, 41/2, 41/2ඒ, 41/3, 41/4, 41/4ඒ, 41/5, 41/5ඒ, 41/6, 41/7, 41/8, 41/8ඒ, 41/8බී, 41/9, 41/10, 41/10ඒ, 41/10ඒ 1/1, 41/11, 41/12, 41/13, 41/14, 41/15, 41/16, 41/17, 41/18, 41/20, 41/20ඒ, 41/21, 41/21ඒ, 41/22 දක්වා | "අරලිය උයන" |

ආර්. ඒ. ශාලිකා එස්. රණවීර,<br>
නාගරික කොමසාරිස්,<br>
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2024 ජුනි මස 27 වැනි දින,<br>
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

07-304/3

---

**කරච්චි ප්‍රාදේශීය සභාව**

මාර්ග නම් කිරීම පිළිබඳව විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙහි 24 වන වගන්තිය ප්‍රකාරව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය සභාවේ අංක 118 දරන 2016.12.09 වන දිනැති පරිපාලන අංක 184/2024 දරන 2024.05.15 දිනැති පරිපාලන නියෝගය ප්‍රකාරව ප්‍රාදේශීය සභා පනත මගින් කරච්චි ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද බලය මත පහත සඳහන් කරනු ලබන මාර්ග 02 කරච්චි ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග වන  බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කරච්චි ප්‍රාදේශීය සභාවේ මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයේ Star Hotel පාර, පරන්තන් නගරය, සිවපාදකලෛයගම් පාසල පාර - පොන්නගර් යන මාර්ග දෙක *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කරන ලදී.

1987  අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙහි 24(2) වගන්තිය ප්‍රකාරව කරච්චි ප්‍රාදේශීය සභාව මගින් හඳුනාගෙන ඇති උක්ත මාර්ග දිවෙන ඉඩම් කොටස සම්බන්ධයෙන් කිසිවකු හිමිකම් පාන්නේ නම් එම තැනැත්තා තම අයිතිය ඔප්පු කිරීම පිණිස තමන් සතුව ඇති ලේඛන සමග තම විරෝධතාවය මෙකී *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කර මාස 03 ක කාලයක් ඉකුත් වීමට පෙර සුදුසු උසාවියක නඩුවක් ගොනු කළ හැකි බව ප්‍රසිද්ධියේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

සෙල්වරාජ් සෙල්වකුමාර්,<br>
ලේකම්,<br>
කරච්චි ප්‍රාදේශීය සභාව,<br>
කිලිනොච්චිය.

| *අනු අංකය* | *වීදියේ අංකය* | *වීදියේ නම* | *වීදියේ ආරම්භය* | *වීදියේ අවසානය* | *වීදියේ දිග (කි. මී)* | *වීදියේ පළල (මීටර්)* | *ග්‍රාම නිලධාරී කොට්ඨාශය/අංකය* | |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | උ.කි.ක.ප්‍රා.ී 1558 | ශිවපාදකලෛයහ පාසල් පාර | A 9 | අරිවියල් නගර් ප්‍රධාන පාර | 1.50 | 10.00 | පොන්නගර් | KN/07 |
| 02 | උ.කි.ක..ප්‍රා.ී 1559 | ස්ටාර් හෝටල් පාර | A 9 | ක්ෂේත්‍ර ඉඩම | 0.20 | 10.00 | පරන්තන්නගර් | KN/44 |

07-348

## වැලිකන්ද ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) යටතේ බලපත්‍ර ලබා දීමට එරෙහිව විරෝධතා කැඳවීම

මෙකී පහත උපලේඛනයේ හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන්හි ගෝ ඝාතකාගාර පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරෝධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ*IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ඩී. වයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ජුනි මස 19 වැනි දින,
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාල සීමාව* |
|---|---|---|---|
| 01 | ආර්. රෆාත් සිරෝස් | අංක 298/2, නව සේනපුර | 2024.07.01 සිට 2024.12.31 දක්වා |

07-351

# විවිධ දැන්වීම්

## අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව

සපයන පෝරම හා සේවා සඳහා ගාස්තු (අය කිරීම්)

අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එච්. සී. පී. සෝමසිරි වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 උපවගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත්, එම පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවරී ඇති බලතල ප්‍රකාරවත් අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ 2024 වර්ෂයට අදාළව සපයන පෝරම හා සේවා ගාස්තු අය කිරීම් යටතේ පහත සඳහන් අය කිරීම් සිදු කරන බව මෙයින් නිවේදනය කර සිටිමි.

01. සභාව සතු මාර්ග පළුදු කිරීම සඳහා ගාස්තු අය කිරීම :

සාමාන්‍ය මාර්ග පළුදු කිරීමට පරිබාහිරව සිදු කරන මාර්ග පළුදු කිරීමක දී, මාර්ග උරහිස (පස්) පළුදු කිරීම සඳහා දික් අඩියකට රු. 50.00 ක මුදලක් අය කිරීම

02. වතුර බවුසරය කුලියට දීම :

ලොරි බවුසරය කුලියට දීමේ දී කි. මී. 1-10 දක්වා දුර සඳහා රු. 8,000.00 ක මුදලක් අය කිරීම.

ඩබ්. එච්. සී. පී. සෝමසිරි,
ලේකම්,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 08 හා 2024 මැයි මස 07 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-208

## ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

### ආදාහනාගාර සේවා ගාස්තු පැනවීම

ප්‍රාදේශීය සභාවේ ලේකම්, බලතල හා කාර්යය කර්තවය ක්‍රියාත්මක කරන ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම්, දිස්නා නිල්මිණි රත්නායක වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග ක්‍රියා කළ යුතු එම පනතේ 122 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 ජූලි 01 සිට 2024 දෙසැම්බර් 31ට අදාළව ආදාහනාගාරයේ සේවා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය 2024.05.21 දින තීරණ අංක 02 යටතේ ලබාගත් බව මෙයින් නිවේදනය කරමි.

| *විස්තරය* | *ගාස්තුව* |
|---|---|
| ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මළ සිරුරක් දැවීම සඳහා | 15,000.00 |
| ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත මළ සිරුරක් දැවීම සඳහා | 17,000.00 |

ලේකම්,
බලතල හා කාර්යය කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
ගොඩකවෙල.

07-345

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ජූලි** | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2024.09.06 | සිකුරාදා | 2024.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.13 | සිකුරාදා | 2024.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.20 | සිකුරාදා | 2024.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.27 | සිකුරාදා | 2024.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.